2020 . 10 . 09 අරුණ පිටු 6

# කොවිඩ් නිසා ලංකා ආර්ථිකයට වෙන දේ ලෝක බැංකුව කියයි

නයන තරංග ගමගේ

කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ඇතිවූ සමස්ත බලපෑම මත 2020දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය (සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන) 6.7%කින් හැකිළෙනු ඇතැයි ලෝක බැංකුව ප්‍රකාශ කරයි. දකුණු ආසියානු කලාපය පදනම් කර ගනිමින් මෙම වර්ෂයේ දෙවැනි වරට ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය ලබන වසරේදී (2021දී) 3.3%ක වර්ධනයක්ද 2020දී 2%ක වර්ධනයක්ද අත්කරගනු ඇතැයි ලෝක බැංකුව අනාවැකි පළ කර තිබිණි.

කලාපයේ ආර්ථිකයන් කෙරෙහි කොවිඩ් -19 වසංගතය විනාශකාරී ලෙස බලපෑම් එල්ල කරමින් සිටින අතර අවිධිමත් රැකියාවල නිරත දකුණු ආසියානුවන් මිලියන ගණනක් අන්ත දරිද්‍රතාවට තල්ලු කිරීමත් සමග දකුණු ආසියාව මෙතෙක් ඉතිහාසයේ දරුණුතම ආර්ථික අවපාතයට ඇදවැටෙනු ඇතැයිද ලෝක බැංකුව අනතුරු අඟවයි. මෙම නවතම වාර්තාවට අනුව 2020දී දකුණු ආසියානු කලාපයේ සමස්ත ආර්ථික හැකිළීම 7.7ක් ලෙස අපේක්ෂිතය.

කොවිඩ් -19 වසංගතයට පෙර පසුගිය වසර 05 තුළ කලාපයේ ආර්ථික වර්ධනය වාර්ෂිකව 6% බැගින් වර්ධනය වී තිබේ. කලාපයේ විශාලතම ආර්ථිකය සතු ඉන්දියාව 2020 මාර්තු මාසයෙන් ආරම්භ වූ මූල්‍ය වර්ෂයේදී 9.6කින් හැකිළෙන නමුත් 2021දී එය නැවත 4.5% දක්වා වර්ධනය වනු ඇතැයිද ලෝක බැංකුව අපේක්ෂා කරයි.